OTARAFOUNDATION

*Caring for animals and nature*

20/08/2015

අතිගරු ජනාධිපති,
මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 03.

ජනාධිපතිතුමනි,

**සත්ත්වෝද්‍යාන සඳහා වන සතුන් ලබාගැනීම පිළිබඳවයි**

පසුගිය රජය සමය තුල ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කිහිපයක නව සත්ත්වෝද්‍යාන කිහිපයක් ආරම්භ කෙරිණි. ඒ අතුරින් පින්නවල, වාගොල්ල සත්ත්වෝද්‍යානය හා හම්බන්තොට, රිදියගම සෆාරි උද්‍යානය දැනට ඉදිකිරීම අවසන් වෙමින් පවතී.

මෙම සත්ත්වෝද්‍යාන ඇතිවීමත් සමග වසර 60 ට වඩා ඉතිහාසයක් ඇති දෙහිවල සත්ත්වෝද්‍යානය කෙරෙහි පාලකයින් හා කළමනාකාරිත්වය තුල ඇති අවධානය අඩුවීමත් සමග දෙහිවල රඳවා සිටින සතුන්ගේ සුභසංධනය ඉතා පහළ මට්ටමකට වැටී ඇත.

මෙවැනි පසුබිමක් තුල සත්ත්වෝද්‍යාන පරිපාලනයේ අවධානය යොමුවී ඇත්තේ කෙසේ හෝ නව සත්ත්වෝද්‍යාන සඳහා වන සතුන් එක්රැස් කිරීමය. මේ සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වනාන්තර තුල අතරමංවී නැවත වනාන්තර තුලට මුදාහැරීමට නියමිත සතුන් ලබාගැනීම හා එම සතුන් ජීවිත කාලය පුරා මිනිසුන්ගේ විනෝදාශ්වාදය සඳහා සිරගත කිරීම ඉතා ඛේදජනක කර්මයකි.

2015/07/26 දරන ලිපිය මගින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය ඒකකය තුල වනාන්තර තුලට මුදා හැරීම සඳහා රැකබලාගත් වලස් පැටවුන් සිව්දෙනෙකු හා කොටි පැටවකු මෙලෙස පින්නවල වාගොල්ලේ නව සත්ත්වෝද්‍යානයට ලබාදෙන ලෙස ලිඛිතව දන්වා ඇත. මේ සඳහා වනජීවී විෂයභාර අමාත්‍යවරයා MTS/SO/18 හා 2015.07.08 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් කිරීම ඉතාමත් හිංසාකාරී ක්‍රියාවකි.

පින්නවල නව සත්ත්වෝද්‍යානය තුල දැනටමත් දිවියන් 06 දෙනෙකු රඳවාගෙන සිටී. එම සතුන් අතරින් 03 දෙනෙකු ගැහැනු සතුන් වන අතර 03 දෙනෙකු පිරිමි සතුන් වේ. මෙලෙස විශාල සතුන් ප්‍රමාණයක් රඳවා ගැනීම ගැටලු සහගත හා ඉතා අමානුශික ක්‍රියාවලියකි. මෙතරම් සතුන් සංඛ්‍යාවක් සිටියදී තවදුරටත් වනාන්තර තුලට මුදාහරින්නට සූදානම් කර තිබූ දිවි පැටවකු ද කුඩු තුල සිරගත කිරීම සංරක්ෂණ ක්‍රියාවලියට මෙන්ම සදාචාරයට ද පටහැනිය. මෑතකදී ලබාගත් දිවි පැටවා සමග දැනට රඳවාගෙන සිටින මුළු සතුන් සංඛ්‍යාව 07 දෙනෙකි.

ශ්‍රී ලංකාවේ වාසය කරන වලසා ලෝක රතු දත්ත වාර්තාවට අනුව දැඩි ලෙස වඳවීයාමට භාජනය වූ සතුන් කාණ්ඩයකි. පින්නවල, වාගොල්ල නව සත්ත්වෝද්‍යානය තුල වලසුන් සඳහා ඉදිකිරීමට නියමිත අරන / කූඩුව වැඩකටයුතු පවා මේ දක්වා නිමවා නොමැත. එවැනි තත්ත්වයක් තුල වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබාගත් වලස් පැටවුන් 04 දෙනා අතුරින් 03 දෙනෙකු තාවකාලිකව හම්බන්තොට සෆාරි උද්‍යානය තුල රඳවා ඇති අතර එක් පැටවකු දෙහිවල සත්ත්වෝද්‍යානය තුල රඳවා ඇත. මෙම සතුන් ලබාදීම පිළිබඳ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරුන් හා නියාමකවරුන් ලිඛිතව තම විරෝධය හා අප්‍රසාදය දක්වා ඇත. එම ලිපි ඔබතුමන්ගේ කාරුණික අවධානය පිණිස අමුණා එවමි. මේ වන විටත් සත්ත්වෝද්‍යාන තුල වලසුන් 05 දෙනෙකු රඳවා ගෙන සිටී, නව පැටවුන් සමග සත්ත්වෝද්‍යාන තුල රඳවාගෙන සිටින මුළු වලසුන් සංඛ්‍යාව 09 කි.

මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් වනාන්තර තුල අතරමංවන වනජීවීන් නැවත පුනරුත්ථාපනය කොට වනාන්තර තුලට මුදාහැරීම නොකොට සත්ත්වෝද්‍යාන තුල සදාකාලික සිරකරුවන් බවට පරිවර්තනය කිරීම අමානුශික මෙන්ම සංරක්ෂණයට පටහැනි ක්‍රියාවලියකි.

සියලු සතුන්ට කරුණාව, මෛත්‍රිය කල යුතුයැයි කියන රටක මිනිසුන් පිනවීමට, මුදල් ඉපයීමට අහිංසක වනසතුන් සදාකාලික සිරකරුවන් බවට පත්කිරීමට එරෙහිව ඔබතුමන්ගේ සහය බලාපොරොත්තු වෙමු. මෙම කාරණය පිළිබඳ කාරුණික අවධානය යොමු කොට මෙවැනි හිංසාකාරී අත්තනෝමතික ක්‍රියාකලාපය හා තීරණ ගැනීමට එරෙහිව ඔබතුමන්ගේ මැදිහත්වීම අපේක්ෂා කරමු.

ස්තුතියි,
මෙයට විශ්වාසී

ඔටාරා ගුණවර්ධන
ඔටාරා පදනම

The Otara Foundation. No.73 Jawatte Road, Colombo 5, Sri Lanka. | T 94(0)11 2581239, 94(0)11 2581240 | Email:info@otarafoundation.com